ආකාස රැකවරණ නිවාසයේ

රැකවරණය ලබන කාන්තාවන්ගේ ආරක්ෂණ ප්‍රතිපත්තිය

2007 ජූනි

ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය

ආකාස

- සංවිධානයේ නම :- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය
- ලියාපදිංචි අංකය :- කො/ප්‍රා/ලේ/00064 -MSS/NSPD/R/65 – L 10116
- සංවිධානයේ ලිපිනය :- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය,

  පහලගම පාර, කෝන්ගොල්ලෑව, තලාව.
- දුරකථන අංකය :- 077 -3121062
- සංවිධානයේ වගකිවයුතු නිලධාරියාගේ නම හා ලිපිනය /දුරකථන අංකය:- එන්.ජී.කමලාවතී

අරමුණ

- යහපත් පාලනයක් මූලිකාංගයක් ලෙස අසරණ වූ ආබාධ සහිත වූ (ළමයින් ,කාන්තාවන් ,වයසක පුද්ගලයින් , ආබාධ සහිත පුද්ගලයින්,සරණාගතයින්,අසාධ්‍ය රෝගීන් යනාදී) සමඟ වැඩකටයුතු කරන සියළුම නියෝජිත ආයතන වලට ආබාධ සහිතවූ කාන්තාවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කිරීමට ස්ථානගත වූ ප්‍රතිපත්තියක් තිබිය යුතුය.

- මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ ආකාස සංවිධානයේ ප්‍රතිපත්ති හා අනුගත වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමයි.

අර්ථ කථනය

- රැකවරණය අවශ්‍ය ආබාධ සහිත කාන්තාවන් සඳහාආරක්ෂිත පරිසරයක් ඇති බවට සහතික කිරීම, ඔවුන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්මට ප්‍රමුඛතාවය ලබාදීම.ප්‍රවේශ විය හැකි ආධාරක සේවා සැපයීම,සහ අන්තර්කරණය සඳහා සවිබල ගැන්වීම, ගෞරවය ලබා දීම.

විස්තරය

- ආකාස නෝවාසික වැඩසටහන් දෙකක් පවත්වනු ලැබේ.
- වයස අවුරුදු 18 – 35 අතර ශාරීරික ,ශ්‍රවනාබාධ හෝ බුද්ධිමය ගැටලු ඇති තරුණ කාන්තාවන් සඳහා ඇති වෘත්තිය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය
- දුප්පත් ,සරණාගත වූ හෝ ආරක්ෂාව අහිමිව ගිය ගැහැණු ළමුන් හා බුද්ධිමය ගැටලු සහිත කාන්තාවන් සඳහා ඇති රැකවරණ මධ්‍යස්ථානය.
- වැඩ සටහන් දෙකෙම ආබාධ සහිත කාන්තාවන් සමග සම්බන්ධවන නිසා එමනේම ආකාස ආරක්ෂාව යටතේ සිටින අසරණ වූ කාන්තාවන් ආකාස වෘතිය පුහුණු මධ්‍යස්ථානයේ සියලුම කාන්තාවන් සහ රැකවරණ නිවාසයේ

අන්තර් ප්‍රකාශය -01

- අනාරක්ෂිතව ජීවත් වන ආබාධ සහිත කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම ඉතා වැදගත් දෙයකි.
- සෑම ආබාධ සහිත කාන්තාවකටම විශේෂත්වයකින් තොරව සියළුම ආකාරයේ අපයෝජන හා අපචාර ක්‍රියාවලින් ආරක්ෂා වීමට අයිතියක් ඇත.(ශාරීරික, ලිංගික, හැඟීම් , සමාජ,ආර්ථික)
- ප්‍රතිපත්තිය කිසිදු විශේෂත්වයකින් තොරව සියළුම ආකාස සංවිධානයේ විධායක සභා සාමාජිකයින්ට, කාර්‍ය මණ්ඩලයට, සිසුන්ට හා ස්වේච්ඡා සාමාජිකයින්ට හා ආබාධ සහිත කාන්තාවන්ට අදාල වේ.
- ඕනෑම ආකාරයක අපචාරයන් ඉතා ප්‍රබල හා සංවේදීව සලකා ආබාධ සහිත කාන්තාවන්ට ආරක්ෂා කිරීමට හා වැරදිකරුවන්ට සුදුසු දඬුවම් ලබාදීමට ඉතා තදින් කටයුතු කරනු ලැබේ.අපචාර සිදු කිරීම සඳහා මගපෙන්වන වැරදි ක්‍රියා නැවත සිදු කිරීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ප්‍රතිපත්තිය - 01

- ආකාස රැකවරණ මධ්‍යස්ථානයේ ජීවත් වන ආබාධ සහිත කාන්තාවන් ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට හා ඔවුන්ගේම නඩත්තුව සඳහා පිළිගත හැකි කටයුත්තකට හැර පරිභාහිර වෙනත් කාර්යකට යොදාගත නොහැක.
- ඔවුන්ගේම නඩත්තුව උදෙසා සාමාන්‍ය දිනයක් පැය 8කට වඩා (පන්ති හා ප්‍රයෝගික) නොයික්මවන අතර එම අභ්‍යාස වල නිරත වීමට පැය 2කට වඩා යොදා ගනු නොලැබේ.
- ක්‍රමානුකූල සති අන්ත අධ්‍යයන නිවාඩු සමඟ සාමාන්‍ය සතියක වැඩකරන දින 5ට වඩා අඩංගු නොවිය යුතුය.
- වෘතිය පුහුණුව ලබන රැකවරණ ලාභීන්ට සෑම දිනකම විවේක ගැනීමට හා පෞද්ගලික දේවල් කරගැනීමට විවේක කාලයක් ලබාදිය යුතුය.
- රැකවරණය ලබන ආබාධ සහිත කාන්තාවන්ට වෙනත් කාන්තාවන් වෙනුවෙන් හෝ විධායක කමිටු සාමාජිකයින් , කාර්‍ය මණ්ඩල හෝ ස්වේච්ඡා සාමාජිකයින් වෙනුවෙන් යම් දෙයක් කිරීමේ වගකීම් දැරිය නොහැක.

ප්‍රතිපත්තිය - 02

- “ආකාස” ඔවුන්ගේ රැකබලාගැනීම යටතේ සිටින සියළුම කාන්තාවන්ට ක්‍රමවත් හා පෝෂ්‍යදායී ආහාර ලබාදීමට වගකීම උසුලයි.

- “ආකාස” ඔවුන්ගේ රැකවරණය යටතේ සිටින සියළුම ආබාධ සහිත කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳව වගකියනු ලැබේ.

- “ආකාස” රැකවරණ ලාභීන් සඳහා පිරිසිදු හා සනීපාරක්ෂක පරිසරයක් ලබාදේ.

- “ආකාස” රැකවරණ ලාභින්ගේ මූලික වෛද්‍ය, සෞඛ්‍ය මට්ටම හා ඕනෑම සෞඛ්‍ය ප්‍රශ්නයකට වෘත්තීමය උපදෙස් ලබාදෙන බවට සහතික වේ.තවදුරටත් “ආකාස “ ඔවුන්ගේ රැකවරණය යටතේ සිටි කාලය තුල ඕනෑම කාන්තාවකගේ වෛද්‍ය හා සෞඛ්‍ය තත්වය පිළිබඳ අතීත වාර්තා පවත්වා ගැනීම අනිවාර්‍ය වේ.

- “ආකාස” කිසිම පුද්ගලයෙකු විසින් රැකවරණ ලාභීන් අපචාර ක්‍රියා හෝ එවැනි ස්වරූපයේ ක්‍රියාවලට යොදවා නොගන්නා බවට සහතික කිරීමේ වගකීම දරයි.

- “ආකාස” කිසිම රැකවරණ ලාභියෙකුට කුමන හෝ ආකාරයකට නොමඟ යැවීම හෝ කුමන ආකාරයකට අපචාරයේ යෙදවීම නොකරන බවට සහතික කිරීමට බැඳී සිටී.

අන්තර ප්‍රකාශනය - 02

- අනුගාමී වූ ප්‍රතිපත්තිය අධීක්ෂණය කිරීම ,අපචාර පිළිබඳ පරීක්ෂණ කිරීම හා යම් සැකයන් සඳහා ආකාස යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ.

- ආකාස මෙම ප්‍රතිපත්තිය පිළිබඳ විධායක කමිටු සාමාජිකයින්, කාර්‍ය මණ්ඩලය , සිසුන් හා ස්වේච්ඡා නිලධාරීන් දැනුවත් කරයි. එමඟින් ඔවුන්ට ඔවුන්ගේ වගකීම් හා අනුරූපීව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් විය හැක.

- ආකාස විධායක සභාව හෝ එහි සාමාජිකයින් , එහි සභාපති හා විධායක අධ්‍යක්ෂ පවතින සම්පත් වලින් හැකි උපරිම ආකාරයට ආරක්ෂිත බඳවා ගැනීම් ,තෝරාගැනීම් හා යෙදවීම් සිදු කිරීමට කැපවී සිටී.

- මෙම ප්‍රතිපත්තිය තුලින් සෞඛ්‍යය, ආරක්ෂාව, අපයෝජන වලින් ආරක්ෂා වීම, හා වැරදි තොරතුරුවලින් ආරක්ෂා වීම ඇතුළුව ආබාධ සහිත කාන්තාවගේ ආරක්ෂාව හා යහපැවැත්ම උදෙසා කරන සියළු දේවල්ද ආවරණය වේ.

ප්‍රතිපත්තිය - 01

- රැකවරණ මධ්‍යස්ථානයේ සියලුම ආබාධ සහිත කාන්තාවන් වයස් ආවුරුදු 18 ට ඉහළ විය යුතුය.

- “ආකාස” වයස අවුරුදු 18 ට අඩු කිසිම කාර්‍ය මණ්ඩල සාමාජිකයෙකුගෙන් කොන්ත්‍රාත්කරුවන් සේවයේ යොදවනු නොලැබේ.

- “ආකාස” වක්‍රව (අතුරු කොන්ත්‍රාත්තුවක් තුලින්)වයස අවුරුදු 18 ට අඩු කිසිම කෙනෙක් සේවයේ යොදවනු නොලැබේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - 02

- ආබාධ සහිත කාන්තාව සඳහා ආරක්ෂක කමිටුව “ප්‍රතිපත්තියට “අනුගාමී වන බවට සහතික කිරීමට පහත තොරතුරු ඇතුලත්ව අවශ්‍ය සියළු ක්‍රියාකාරකම් භාරගනු ලැබේ.
- මෙම ප්‍රතිපත්තිය පිළිබඳව සියළුම විධායක කමිටු සාමාජිකයින්, කාර්‍ය මණ්ඩලය, රැකවරණ ලාභීන් හා ස්වේච්ඡා සාමාජිකයින් දැනුවත් කිරීම
- රැකවරණ ලාභිනියන්ගේ සමාන්‍ය තත්වය , සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳ ක්‍රමාණුකූල වාර්තා ඔවුන්ට ඉදිරිපත් කරන බවට සහතික වීම
- වාර්තා වල නිවර්දූභාවය තහවුරු කිරීමට හා තත්වය පිළිබඳ විමසීම සඳහා ක්‍රමාණුකූල සංචාර වල නිරත වීමට භාරගැනීම
- ප්‍රතිපත්ති කඩවීමක් හෝ ඊට අනුකූල නොවීමක් පෙනී යනවිට හෝ වාර්තා වූ විට ඉක්මන් හා තදබල ක්‍රියා මාර්ග ගැනීම

ප්‍රතිපත්තිය - 03

- කාර්‍ය මණ්ඩල, ආබාධ සහිත කාන්තවන් හා ස්වේච්ඡා සාමාජිකයින් මඟින් පහත දේවල් සිදුවීම පිළිගත නොහැක.
- අන් අයට නොපෙනෙන ආකාරයට කිසියම් රැකවරණ ලාභිනියක සමඟ තනිවම අතිරේක කාලය ගත කිරීම
- කිසිම රැකවරණ ලාභිනියකට ශාරීරිකව පහරදීම හෝ දඬුවම කිරීම
- රැකවරණ ලාභිනියක සමඟ එකම කාමරයේ රැයක් ගත කිරීම
- ඔවුන්ට ඔවුන් විසින්ම කරගත හැකි පෞද්ගලික උපකාර කිරීම
- රැකවරණ ලාභිනියක සමඟ ලිංගික සබඳතාවක් පවත්වා ගැනීම
- අපචාරාත්මක හෝ අපයෝජනාත්මක ආකාරයේ ක්‍රියාවක යෙදීම හෝ රැකවරණ ලාභිනියක අවධානම් තත්වයකට පත් කරවීම
- පෞදගලික කටයුතු/ප්‍රතිලාභ සඳහා රැකවරණ ලාභිනියන් යොදවා ගැනීම
- නීති විරෝධී ලෙස සැලකෙන ක්‍රියාවක හෝ හැසිරීමක රැකවරණ ලාභිනියකු සමඟ යෙදීම
- රැකවරණ ලාභින් ලැජ්ජාවට පත් කිරීමේ හා උපහාසයට ලක් කිරීමේ චේතනාවෙන් කටයුතු කිරීම
- යම් විශේෂිත රැකවරණ ලාභිනියකට පහත් කොට සැලකීම් හෝ පක්ෂපාතීත්වයක් පෙන්වීම

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - 01

- "ආකාස" මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන වර්තමාන සභාපති,කාර්‍ය මණ්ඩල නොවන විධායක සභා සාමාජිකයෙකු යන අයගෙන් සමන්විත විශේෂ රැකවරණ ලාභීන් ආරක්ෂණ කොමිසමක් පත් කරනු ලැබේ.
- කාර්‍ය මණ්ඩල නොවන විධායක සභා සාමාජිකයාගේ නිල කාලය උපරිම නිල දෙකකට යටත්ව අවුරුද්දක් වේ.ඇයගේ තෝරාපත් කරගැනීම විධායක් සභාවේ බහුතර ඡන්දයෙන් සිදු වේ.
- කාර්‍ය මණ්ඩල සාමාජිකයෙකුගේ නිල කාලය උපරිම නිල දෙකකට යටත්ව අවුරුද්දකි.ඔහුව/ඇයව තෝරාගනු ලබන්නේ කාර්‍ය මණ්ඩලයේ බහුතර ඡන්දයෙනි.
- මෙම කමිටුව අඩුම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්වේ. ඔවුන් සෑම මාස හයකට වරක්ම විධායක කමිටුවට ලිඛිත වාර්තා ලබාදේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - 02

- රැකවරණ ලාභීනි ආරක්ෂණ කමිටුව "ප්‍රතිපත්තියට" අනුගාමී වන බවට සහතික කිරීමට පහත තොරතුරු ඇතුලත්ව අවශ්‍ය සියළු ක්‍රියාකාරකම් භාර ගනු ලැබේ.
  - මෙම ප්‍රතිපත්තිය පිළිබඳව සියළුම විධායක කමිටු සාමාජිකයින් , කාරය මණ්ඩලය ,රැකවරණ ලාභීන් හා ස්වේච්ඡා සාමාජිකයින් දැනුවත් කිරීම
  - රැකවරණ ලාභී කාන්තාවන් සාමාන්‍ය තත්වය , සෞඛ්‍ය හා යහ පැවැත්ම පිළිබඳ ක්‍රමානුකූල වාර්තා ඔවුන්ට ඉදිරිපත් කරන බවට සහතික වීම
  - වාර්තා වල නිරවද්‍යභාවය තහවුරු කිරීමට හා තත්වය පිළිබඳ විමසීම සඳහා ක්‍රමානුකූල සංචාර වල නිරත වීමට භාරගැනීම
  - ප්‍රතිපත්ති කඩ වීමක් හෝ ඊට අනුකූල නොවීමක් පෙනී යන විට හෝ වාර්තා වූ විට ඉක්මන් හා තද බල ක්‍රියාමාර්ග ගැනීම
  - කිසියම් පිම්බිලි හෝ සැකයන් අඩුම තරමින් රැකවරණ ලාභී ආරක්ෂණ කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු විසින් පැය 48 ක් ඇතුලත පරීක්ෂණ පැවැත්විය යුතුය.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - 03

- ප්‍රතිපත්ති කඩ කිරීම පිළිබඳ රැකවරණ ලාභී ආරක්ෂණ කමිටුව මඟින් විධායක කමිටු සාමාජිකයෙකු, කාරය මණ්ඩල සාමාජිකයෙකු, හෝ ස්වේච්ඡා සාමාජිකයෙකු වැරදිකරු බවට පත්වුව හොත් ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
- ගනු ලබන ක්‍රියාමාර්ග
  - ❖ පළමු අවස්ථාවේ සුළු අපචාර සඳහා අවම වාචික හා ලිඛිත අවවාදයක් කිරීම(රැකවරණ ලාභියාගේ ආරක්ෂාවට හානියක් නොවන ආකාරයට)
  - ❖ නැවත නැවත වැරදි සිදු කරන විධායක කමිටු සාමාජිකයින්, කාර්‍ය මණ්ඩල සාමාජිකයින් හෝ ස්වේච්ඡා සාමාජිකයින් සේවයෙන් පහ කිරීම
  - ❖ රැකවරණ ලාභින්ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති කරන, ඔවු ශාරීරික අපචාර වල යොදවන හෝ නීති විරෝධී ක්‍රියාවල යොදවන ආකාරයේ තදබල පළමු අවස්ථාවේ සිදු කරන වැරැද්දකදී ඔවුන්ගේ වැඩ තහනම් කිරීම හා විධායක කමිටු සාමාජිකයින්, කාර්‍ය මණ්ඩල සාමාජිකයින් හෝ ස්වේච්ඡා සාමාජිකයින් සේවයෙන් පහ කිරීම
  - ❖ සියළුම ආකාරයේ ක්‍රියා අදාල නීතිමය බලධාරීන් යටතේ ලියාපදිංචි කෙරේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම - 04

- ❖ රැකවරණ ලාභී ආරක්ෂණ කමිටුව පැමිණිලි කරන ආබාධ සහිත කාන්තාවන් , විධායක කමිටු සාමාජිකයින්, කාර්‍ය මණ්ඩල සාමාජිකයින් හෝ ස්වේච්ඡා නිලධාරීන්ගේ රහස්‍යභාවය පවත්වාගනු ලැබේ.
- ❖ රැකවරණ ලාභී ආරක්ෂණ කමිටුව ප්‍රතිපත්ති උල්ලංඝණය කල ඕනෑම රැකවරණ ලාභියෙකුටම පුනරුත්ථාපන පියවර ඉතා ඉක්මනින් ගනු ලබන බවට සහතික වේ.ඔවුන් එම රැකවරණ ලාභියා පිළිබඳ අවම වශයෙන් මාස 06 ක් වන තුරු සොයා බැලීම සිදු කරයි.
- ❖ රැකවරණ ලාභී ආරක්ෂණ කමිටුව, නීති හා ප්‍රතිපත්ති උල්ලංඝණය කිරීමට මඟපාදන කරුණු මඟහැරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබන බවට සහතික වේ.මෙය මාසයක් ඇතුලත සිදු කරන බවට සහතික කිරීම සභාපති දරනු ඇත.

පොරොන්දු ප්‍රකාශය

මෙම ප්‍රතිපත්තිය ආකාස සංවිධානයේ විධායක සභාව විසින් ඔවුන්ගේ රාජකාරී ක්‍රමයේ කොටසක් වශයෙන් පිළිගෙන ඇත.එලෙසම එම පොරොන්දුව ව්‍යවස්ථාවේ සඳහන් කොට ඇත.